# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ
# උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුරු සහ ශිෂ්‍ය පොලිස් නිලධාරී / නිලධාරිනී තනතුරු සඳහා
# අයදුම්පත් කැඳවීම

01. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය රත්මලාන සහ දක්ෂිණ මණ්ඩපය සූරියවැව උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී / නිලධාරිනී හෝ ශිෂ්‍ය පොලිස් නිලධාරී/නිලධාරිනී තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් **2022 අගෝස්තු 29 දින සිට 2022 සැප්තැම්බර් 26 දින** දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

02. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය සේවයේ අධිකාරී තනතුරු හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගන්නා ලදුව, උපාධියට නියමිත හමුදා/පොලිස් සහ අධ්‍යයන විෂයයන් සාර්ථකව නිම කිරීමට සමත් වන කෙඩෙට් නිලධාරී/ නිලධාරිනියන්ට හා ශිෂ්‍ය පොලිස් නිලධාරී/නිලධාරිනියන්ට උපාධි පිරිනැමීම සඳහා, 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත හා එම පනතේ සංශෝධන මගින් බලය පවරා ඇති විශ්වවිද්‍යාලයකි.

03. • මෙම උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී/නිලධාරිනි සහ ශිෂ්‍ය පොලිස් නිලධාරී/නිලධාරිනී තනතුරු වලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය රත්මලාන හිදී පහත පාඨමාලාවන් පැවැත්වේ.

i. වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී (එම්.බී.බී.එස්) උපාධිය වර්ෂ පහක් (5)
ii. විද්‍යාවේදී (බී.එස්.සී.) ඉංජිනේරු (ගෞරව) උපාධිය වර්ෂ හතරක් (4)
iii. විද්‍යාවේදී (බී.එස්.සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධිය වර්ෂ හතරක් (4)
iv. විද්‍යාවේදී (බී.එස්.සී.) භටකාර්ය කළමනාකරණ උපාධිය වර්ෂ තුනක් (3)
v. විද්‍යාවේදී කළමනාකරණ හා තාක්ෂණික විද්‍යා උපාධිය වර්ෂ තුනක් (3)
vi. විද්‍යාවේදී (බී.එස්.සී.) සමාජ විද්‍යා උපාධිය වර්ෂ තුනක් (3)
vii. වෙනත් භාෂා කථා කරන්නන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (TESOL) වර්ෂ තුනක් (3)
viii. විද්‍යාවේදී (බී.එස්.සී.) ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධිය වර්ෂ තුනක් (3)
ix. ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) ඉදිකිරීම් තාක්ෂණ උපාධිය වර්ෂ හතරක් (4)
x. විද්‍යාවේදී (බී.එස්.සී.) පොලිස් විද්‍යා උපාධිය වර්ෂ තුනක් (3)
xi. විද්‍යාවේදී (බී.එස්.සී.) අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති උපාධිය වර්ෂ තුනක් (3)

• මෙම උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී/නිලධාරිනි තනතුරු වලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සූරියවැව දක්ෂිණ මණ්ඩපය තුළ පහත පාඨමාලා පැවැත්වේ.

xii. වාස්තුවිද්‍යාවේදී උපාධිය වර්ෂ පහක් (5)
xiii. විද්‍යාවේදී (බී.එස්.සී.) ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) උපාධිය වර්ෂ හතරක් (4)
xiv. විද්‍යාවේදී (බී.එස්.සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධිය වර්ෂ හතරක් (4)
xv. විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු තාක්ෂණ (ගෞරව) උපාධිය වර්ෂ හතරක් (4)
xvi. තාක්ෂණවේදී (ගෞරව) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපාධිය වර්ෂ හතරක් (4)

• ශිෂ්‍ය පොලිස් නිලධාරීන්/නිලධාරිනියන් සඳහා වන උපාධි පාඨමාලාව ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය රත්මලාන හිදී පැවැත්වේ.

වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී උපාධිය වර්ෂ පහක් (5) ක් වේ.

• ඉහත උපාධි පාඨමාලාවන් සඳහා තෝරා ගන්නා ලද කෙඩෙට් නිලධාරී/ නිලධාරිනියන් හා ශිෂ්‍ය පොලිස් නිලධාරී/ නිලධාරිනියන් උපාධි පාඨමාලාව ආරම්භ වීමට පෙර උපරිමය මාස හයකට යටත්ව අනිවාර්ය මූලික හමුදා/පොලිස් පුහුණුවකට අනුයුක්ත කරනු ලැබේ.

3.1 උපාධි පාඨමාලාවන් සඳහා බඳවා ගනු ලබන කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් හා ශිෂ්‍ය පොලිස් නිලධාරීන්/නිලධාරිනියන් ත්‍රිවිධ හමුදාවට සහ ශ්‍රී ලංකා පොලීසියට අනුයුක්ත කිරීම එම හමුදාවල සහ පොලීසියේ ඇති පුරප්පාඩු සංඛ්‍යාව සහ තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණවලදී අපේක්ෂකයින්

ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාව පදනම් කොට ගෙන සිදුකෙරෙනු ඇත. උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ, නාවික හමුදාවේ, ගුවන් හමුදාවේ නිත්‍ය බල සේනාවල අධිකාරීලත් තනතුරු සඳහාද ශිෂ්‍ය පොලිස් නිලධාරීන්/නිලධාරිනියන් ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ තනතුරු සඳහා ද පත්කරනු ලැබේ.

3.2 නියමිත උපාධි පාඨමාලා සහ හමුදා/පොලිස් පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ පරිදි ඔවුනට

- වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී (එම්.බී.බී.එස්) උපාධිය
- විද්‍යාවේදී (බී.එස්.සී.) ඉංජිනේරු (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී (බී.එස්.සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී (බී.එස්.සී.) හටකාර්ය කළමනාකරණ උපාධිය
- විද්‍යාවේදී කළමනාකරණ හා තාක්ෂණික විද්‍යා උපාධිය
- විද්‍යාවේදී (බී.එස්.සී.) සමාජ විද්‍යා උපාධිය
- වෙනත් භාෂා කථා කරන්නන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (TESOL)
- විද්‍යාවේදී (බී.එස්.සී.) ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධිය
- ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) ඉදිකිරීම් තාක්ෂණ උපාධිය
- විද්‍යාවේදී (බී.එස්.සී.) පොලිස් විද්‍යා උපාධිය
- විද්‍යාවේදී (බී.එස්.සී.) අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති උපාධිය
- වාස්තුවිද්‍යාවේදී උපාධිය
- විද්‍යාවේදී (බී.එස්.සී.) ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී (බී.එස්.සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු තාක්ෂණ (ගෞරව) උපාධිය
- තාක්ෂණවේදී (ගෞරව) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපාධිය හෝ

පිරිනමනු ලැබේ

3.3 සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

3.4 තෝරාගනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ සුදුසුකම් වලට අනුකූලව පහත දැක්වෙන උපාධි පාඨමාලාවලින් එකක් හැදෑරිය යුතුය.

**(i)** වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී (එම්.බී.බී.එස්) උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ පහයි. (වර්ෂ: 5) - (කාන්තා/පිරිමි)

2021 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයන් සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් (02) හා සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් (01) සහිතව ජීව විද්‍යා විෂය ධාරාව හදාරනු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් "C" සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

සැ. යු : කෙසේ වුවද වයස අවුරුදු 17ට අඩු අයෙකු 2020 වර්ෂයේදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනී සිට සුදුසුකම් ලබා තිබුණහොත් එම ප්‍රතිඵල සලකා බලනු ලැබේ.

**(ii)** විද්‍යාවේදී (බී.එස්.සී.) ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලාව : ගුවන්යානා ඉංජිනේරු /ජීව වෛද්‍ය ඉංජිනේරු / සිවිල් ඉංජිනේරු / විදුලි හා විද්‍යුත් ඉංජිනේරු / විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු / නාවික ඉංජිනේරු / යාන්ත්‍රික ඉංජිනේරු /මෙකාට්‍රොනික් ඉංජිනේරු / ගොඩනැගිලි සේවා ඉංජිනේරු / නාවික වාස්තු විද්‍යාව හා නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 4) - (කාන්තා/පිරිමි)

2021 හෝ 2020 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් සහිතව ගණිතය විෂය ධාරාව හදාරණු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 කදී අවම වශයෙන් "B" සාමාර්ථ්‍යය දෙකක් (02) හා "C" සාමාර්ථ්‍යය එකක් (01) සහිතව 2022 හෝ 2021 වර්ෂවලදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිටි සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

**(iii)** විද්‍යාවේදී (බී.එස්.සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 4) - (පිරිමි)

2021 හෝ 2020 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව යන විෂයන් දෙක සමග රසායන විද්‍යාව , උසස් ගණිතය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයක් සමග ගණිතය විෂය ධාරාව යටතේ අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් සහිතව හෝ සමාන විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිටි සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

**(iv)** විද්‍යාවේදී (බී.එස්.සී) හටකාර්ය කළමනාකරණ උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ තුනයි. (වර්ෂ: 3). - (කාන්තා/පිරිමි)

2021 හෝ 2020 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ජීව විද්‍යා විෂය ධාරාව, ගණිත විෂය ධාරාව හෝ වාණිජ විෂය ධාරාව හදාරානු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

**(v)** විද්‍යාවේදී (බී.එස්.සී) කළමනාකරණ හා තාක්ෂණික විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ තුනයි. (වර්ෂ:3) - ( කාන්තා/පිරිමි)

2021 හෝ 2020 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ජීව විද්‍යා විෂය ධාරාව හෝ ගණිත විෂය ධාරාව හදාරානු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

**(vi)** විද්‍යාවේදී (බී.එස්.සී) සමාජ විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ තුනයි. (වර්ෂ: 3) - (කාන්තා/පිරිමි)

2021 හෝ 2020 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ඕනෑම විෂය ධාරාවක් හදාරනු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

**(vii)** වෙනත් භාෂා කථා කරන්නන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (**TESOL**) වර්ෂ තුනයි (වර්ෂ: 3) - (කාන්තා/පිරිමි)

2021 හෝ 2020 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ඕනෑම විෂය ධාරාවක් හදාරනු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය. අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි විෂයට අවම **B** සාමාර්ථයක් තිබිය යුතුය.

**(viii)** විද්‍යාවේදී (බී.එස්.සී) ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධි පාඨමාලාව ඃ කාලසීමාව වර්ෂ තුනයි (වර්ෂඃ 3) - (කාන්තා/පිරිමි)

2021 හෝ 2020 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ඕනෑම විෂය ධාරාවක් හදාරනු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

**(ix)** ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) ඉදිකිරීම් තාක්ෂණ උපාධිය වර්ෂ හතරයි ( වර්ෂඃ 4) - (පිරිමි)

2021 හෝ 2020 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ගණිතය විෂය ධාරාව හදාරණු ලැබූ හෝ තාක්ෂණික විෂය මාලාව යටතේ (ඉංජිනේරු තාක්ෂණය , තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයන් දෙක සමග වෙන ඕනෑම විෂයක් සහිතව සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් ලබා සිටීම හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

මීට අමතරව අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අපොස සාමාන්‍ය පෙළ විභාගයේදී සපුරා තිබිය යුතුය.

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේදී ඉංග්‍රීසි , ගණිතය හා විද්‍යාව යන විෂයන් ට සම්මාන සාමාර්ථයක් ‘’(C)’’ ලබා තිබීම හෝ කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් සාමාන්‍ය පෙළ (Cambridge/ Edexcel O/L) හෝ ඒ හා සමාන විදේශ අධ්‍යාපන සුදුසුකමක් සැලකීමේදී ඉංග්‍රීසි විෂයට අවම "C" සාමාර්ථයක් හා ගණිතය හා විද්‍යාව යන විෂයන්ට අවම "D" සාමාර්ථයක් තිබිය යුතුය.

**(x)** විද්‍යාවේදී (බී.එස්.සී.) පොලිස් විද්‍යා උපාධිය අවුරුදු තුනයි (වර්ෂ 3) - (පිරිමි)

2021 හෝ 2020 වසර වල අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් පහත සඳහන් විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් සහිතව හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

පහත සඳහන් A ලැයිස්තුවෙන් විෂයන් තුනක් හෝ A ලැයිස්තුවෙන් විෂයන් දෙකක් හා B ලැයිස්තුවෙන් එක් විෂයක් සහිතව සමත් වී තිබිය යුතුය.

**A** ලැයිස්තුව

ගිණුම්කරණය
භූගෝල විද්‍යාව
ව්‍යාපාර සංඛ්‍යානය
තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
භෞතික විද්‍යාව
සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
දේශපාලන විද්‍යාව
ජීව විද්‍යාව
රසායන විද්‍යාව
ගණිතය/ සංයුක්ත ගණිතය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
කෘෂි විද්‍යාව
උසස් ගණිතය
ව්‍යාපාර අධ්‍යයනය
ආර්ථික විද්‍යාව
නීතිය

**B** ලැයිස්තුව

බුද්ධාගම
බෞද්ධ ශිෂ්ටාචාරය
ක්‍රිස්තියානි ආගම / ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය
ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය
ජපන් භාෂාව
ඉංග්‍රීසි (විෂය අංක 73)
සංස්කෘත භාෂාව
හින්දු ආගම/හින්දු ශිෂ්ටාචාරය
කෘෂි තාක්ෂණය
ඉස්ලාම් ආගම / ඉස්ලාම් ශිෂ්ටාචාරය
චීන භාෂාව
පාලි භාෂාව
ජර්මන් භාෂාව
දෙමළ භාෂාව
ප්‍රංශ භාෂාව
සිංහල භාෂාව
අරාබි භාෂාව

මීට අමතරව අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල හෝ දෙමළ විෂයන්ට සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම.

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී හෝ කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි විෂයට සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම.

**(xi)** විද්‍යාවේදී (බී.එස්.සී.) අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති උපාධිය වර්ෂ තුනයි (වර්ෂ:3) - (පිරිමි)

**2021** හෝ 2020 වසරවල අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් පහත සඳහන් විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් සහිතව හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් "D" සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

පහත සඳහන් A ලැයිස්තුවෙන් විෂයන් තුනක් හෝ A ලැයිස්තුවෙන් විෂයන් දෙකක් හා B ලැයිස්තුවෙන් එක් විෂයක් සහිතව සමත් වී තිබිය යුතුය.

**A** ලැයිස්තුව

ගිණුම්කරණය
භූගෝල විද්‍යාව
ව්‍යාපාර සංඛ්‍යානය
තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
භෞතික විද්‍යාව

සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
දේශපාලන විද්‍යාව
ජීව විද්‍යාව
රසායන විද්‍යාව
ගණිතය/ සංයුක්ත ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
කෘෂි විද්‍යාව
උසස් ගණිතය
ව්‍යාපාර අධ්‍යයනය
ආර්ථික විද්‍යාව
නීතිය

**B** ලැයිස්තුව

බුද්ධාගම
බෞද්ධ ශිෂ්ඨාචාරය
ක්‍රිස්තියානි ආගම / ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය
ග්‍රීක හා රෝම ශිෂ්ඨාචාරය
ජපන් භාෂාව
ඉංග්‍රීසි (විෂයය අංක 73)
සංස්කෘත භාෂාව
හින්දු ආගම/හින්දු ශිෂ්ඨාචාරය
කෘෂි තාක්ෂණය
ඉස්ලාම් ආගම / ඉස්ලාම් ශිෂ්ඨාචාරය
චීන භාෂාව
පාලි භාෂාව
ජර්මන් භාෂාව
දෙමළ භාෂාව
ප්‍රංශ භාෂාව
සිංහල භාෂාව
අරාබි භාෂාව

මීට අමතරව අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල හෝ දෙමළ විෂයයන්ට සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම.

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී හෝ කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම.

**(xii)** වාස්තුවිද්‍යාවේදී උපාධිය : කාලසීමාව වර්ෂ පහයි. (වර්ෂ: 05) - (කාන්තා/පිරිමි)

2021 හෝ 2020 වර්ෂයේ දී අපොස (උ/පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) තුනක් (03) ලබා තිබීම හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් තුනකට (03) අවම වශයෙන් "D" සාමාර්ථය තුනක් (03) සහිතව 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

i. අවම වශයෙන් පහත ලැයිස්තුවෙන් එක් විෂයයක්
ජීව විද්‍යාව
උසස් ගණිතය
රසායන විද්‍යාව
භෞතික විද්‍යාව
සංයුක්ත ගණිතය
චිත්‍ර
භූගෝල විද්‍යාව

*සහ*

ii. පහත ලැයිස්තුවෙන් එක් විෂයයක් හෝ විෂයයන් කිහිපයක්

| | |
|---|---|
| ගිණුම්කරණය | චීන |
| හින්දු ශිෂ්ටාචාරය | ගෘහ ආර්ථික විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ඉස්ලාම් ශිෂ්ටාචාරය | ගණිතය |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | සංස්කෘත |
| දේශපාලන විද්‍යාවේ මූලිකාංග | ජර්මන් |
| ඉංග්‍රීසි (විෂයය අංක 73) | අරාබි |
| සිංහල | ඉතිහාසය |
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ව්‍යාපාර අධ්‍යයනය |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | ජපන් |
| හින්දි | ආර්ථික විද්‍යාව |
| බෞද්ධ ශිෂ්ටාචාරය | පාලි |
| ප්‍රංශ | දෙමළ |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | කෘෂි විද්‍යාව |

*සහ*

**iii.** අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම හෝ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබීම හෝ කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයෙන් ගණිතය විෂයයට "D" සාමාර්ථයක් ලබා තිබීම

*සහ*

**iv.** කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් පවත්වන අවකාශීය ඥානය පිළිබඳ ඇගයීම් පරීක්ෂණය සමත් විය යුතුය.

**(xiii)** විද්‍යාවේදී (බී.එස්.සී.) ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 04) - (පිරිමි)

2021 හෝ 2020 වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) තුනක් (03) ලබා තිබීම හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන "D" සාමාර්ථය තුනක් (03) සහිත 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

පහත දැක්වෙන විෂයයන් අතුරින් අවම වශයෙන් එක් විෂයයක්:

සංයුක්ත ගණිතය /උසස් ගණිතය

*සහ*

පහත දැක්වෙන විෂයයන්ගෙන් අනෙකුත් විෂයය / විෂයයන්

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | ආර්ථික විද්‍යාව | ව්‍යාපාර සංඛ්‍යානය |
| ව්‍යාපාර අධ්‍යයනය | භෞතික විද්‍යාව | රසායන විද්‍යාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

ඊට අමතරව, අපේක්ෂකයන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් ද සපුරා තිබිය යුතුය.

ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ්‍යයක් සහ විද්‍යාව විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යයක්

*හෝ*

කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් සාමාන්‍ය පෙළ (Cambridge/ Edexcel O/L) විභාගයෙන් ගණිතය විෂයයට සහ විද්‍යාව විෂයයන්ට “D” සාමාර්ථ්‍යයක් ලබා තිබීම

**(xiv)** විද්‍යාවේදී (බී.එස්.සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 04) - (පිරිමි)

2021 හෝ 2020 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ගණිතය විෂයය ධාරාව හදාරනු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ ගණිතය විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය , භෞතික විද්‍යාව යන විෂයයන් දෙක සමග , රසායන විද්‍යාව , උසස් ගණිතය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන්ගෙන් එකක් සමග උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

**(xv)** විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු තාක්ෂණ (ගෞරව) උපාධිය වර්ෂ හතරයි (වර්ෂ: 4)- (පිරිමි)

2021 හෝ 2020 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව තාක්ෂණය විෂය ධාරාව හැර ජීව විද්‍යා විෂයය ධාරාව, ගණිත විෂයය ධාරාව හෝ වාණිජ විෂයය ධාරාව හෝ කලා විෂය ධාරාව හදාරනු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

**(xvi)** තාක්ෂණවේදී (ගෞරව) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපාධිය : කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4) - (පිරිමි)

2021 හෝ 2020 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් සහිතව ගණිත විෂයය ධාරාව ( රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය), ජීව විද්‍යා විෂයය ධාරාව (ජීව විද්‍යාව , රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව ) හෝ තාක්‍ෂණ විෂයය ධාරාව ( ඕනෑම විෂයයන් තුනක් ) හදාරනු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය “D” තුනක් (03) සහිතව 2022 හෝ 2021 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනී සිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

*මීට අමතරව*

උපාධි පාඨමාලාව සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථ්‍ය (C) ලබා තිබීම සහ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ Cambridge / Edexcel General Certificate of Secondary Education (GCSE) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට සම්මාන සාමාර්ථ්‍යයක් (C) හා විද්‍යාව, ගණිතය විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථ්‍ය (D) ලබා තිබීම අනිවාර්ය වේ.

3.5 තෝරාගනු ලබන කෙඩෙට් නිලධාරීන්/ නිලධාරිනියන් හෝ ශිෂ්‍ය පොලිස් නිලධාරී/ නිලධාරිනියන් එම පාඨමාලාවට අදාල පොදු විෂයයන්ට අමතරව ඒ ඒ උපාධි පාඨමාලාවට අදාල වන පරිදි ඉංග්‍රීසි, කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, නීතිය, අන්තර් ජාතික අධ්‍යයනය හා හමුදා විෂයයන්ද අනිවාර්යයෙන්ම හැදෑරිය යුතුය.

3.6 මීට අමතරව ශාරීරික වර්ධනය, සරඹ හා අවි පුහුණුව, නායකත්වය ආදිය පිළිබඳව ද පාඨමාලා කාලය තුළදී අඛණ්ඩ පුහුණුවීම් වල යෙදිය යුතුය.

04. අ <u>උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී/නිලධාරිනි හා ශිෂ්‍ය පොලිස් නිලධාරී /නිලධාරිනී තනතුර සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම්</u>

<u>අයදුම්කරු</u>

1. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු වේ.

11. 2022 සැප්තැම්බර් 26 වෙනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 22 ට නොවැඩි විය යුතු වේ.

111. අ.පො.ස. (උ/පෙ) සාමාන්‍ය පොදු පරීක්ෂණයෙන් සමත් වී තිබීම (අවම ලකුණු - 30)

1**v.** ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලැබූවකු විය යුතු වේ.

**v.** අවිවාහක විය යුතු වේ. (උපාධි අපේක්ෂක නිලධාරියෙකුට/ නිලධාරිනියකට පුහුණුවීම් කාලය තුළදී විවාහ වීමට අවසර නොමැති අතර සේවා රෙගුලාසි මගින් අවකාශ සැලසෙන තෙක් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.)

ආ. <u>අධ්‍යාපන සුදුසුකම්</u> :-

**(i)** සියලුම උපාධි පාඨමාලා සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට සම්මාන (C) සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ Cambridge / Edexcel General Certificate of Secondary Education (GCSE) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට "C" සාමාර්ථ්‍යයක් ලබා තිබීම අනිවාර්ය වේ. වෙනත් භාෂා කථා කරන්නන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (TESOL) සඳහා අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි විෂයට අවම B සාමාර්ථ්‍යයක් තිබිය යුතුය.

**(ii)** ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත සුදුසුකම් ලැබීමට පහත නිර්ණායකයන් ද සපුරා තිබිය යුතුය. සියලුම උපාධි පාඨමාලා සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථ්‍ය (C) සහිතව සම්මාන සාමාර්ථ්‍ය (C) 06 සමග අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් විය යුතුය. (අතිරේක විෂයයන් සලකා බලනු නොලැබේ) සිංහල හෝ දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය (S) සාමාර්ථ්‍යයක් ලබා තිබිය යුතුය.

**(iii)** විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනී සිටි සිසුන් අවම වශයෙන් අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් සිංහල / දෙමළ භාෂා විෂයට සම්මාන සාමාර්ථ්‍ය (C) ලබා තිබිය යුතුය.

විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවෙකු, අයදුම් කරන මොහොතේ දී ඉහත සුදුසුකම සපුරා නොමැති නම් ඔහුව/ඇයව කෙඩෙට් නිලධාරියෙකු ලෙස බඳවාගත් දින සිට වසර දෙකක් ඇතුලත අ.පො.ස. (සා/පෙ) විභාගයට පෙනීසිට සිංහල/දෙමළ භාෂාව විෂයට සම්මාන සාමාර්ථ්‍යයක් (C) ලබාගත යුතුයි. ඉහත සුදුසුකම නියමිත වසර දෙක තුළදී සපුරනු නොලබන කෙඩෙට් නිලධාරීන්/නිලධාරිණියන් අදාළ සේවයෙන් ඉවත් කරනු ලැබේ.

ඇ.පහත සඳහන් අවම ශාරීරික මිනුම් (සම්මතයන්) සපුරාලිය යුතුය.

| | | යුද | | නාවික | | ගුවන් | | පොලිස් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| උස | වෛද්‍ය | 5' 6" | 5' 3" | සෙ.මී. 168 | සෙ.මී. 160 | 5' 5" සෙ.මී. 165 | 5' 3" සෙ.මී. 160 | 5' 6" | 5' 3" |
| | වෙනත් උපාධි පාඨමාලා | 5' 6" | 5' 3" | සෙ.මී. 168 (සෙ.මී. 171 Provost Branch) | සෙ.මී. 160 (සෙ.මී. 163 Provost Branch) | 5' 6" (සෙ.මී. 167.5) | 5' 4" (සෙ.මී. 162.5) | - | - |
| බර | | කි.ග්‍රෑ. 50 | - | කි.ග්‍රෑ. 52 | කි.ග්‍රෑ. 41 | - | - | - | - |
| ශරීර ස්කන්ධ දර්ශකය | | - | - | - | - | <26 සහ >17 | <25 සහ >17 | - | - |
| පපුව | | 32" (ප්‍රාශ්වාස) | - | 81 cm | - | 32" (අවමය සෙ.මී. 81) | - | 32" (ප්‍රාශ්වාස) | - |

| පෙනීම | | යුද | | | නාවික | | | ගුවන් | | | පොලිස් | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | **L** | **R** | **CP** | **L** | **R** | **CV** | **L** | **R** | **CP** | **L** | **R** | **CP** |
| වෘත්තීය කාණ්ඩය | උපැස් රහිත | 6/18 | 6/18 | CP 2 | 6/18 | 6/18 | 24/24 By Ishihara's plates | 6/18 | 6/18 | CP 2 | 6/18 | 6/18 | CP 2 |
| | නිවැරදි කරන ලද දෘෂ්ඨිය | 6/6 | 6/6 | CP 2 | - | - | - | 6/6 | 6/6 | CP 2 | 6/6 | 6/6 | CP 2 |
| | උපැස් සහිත | - | - | - | 6/6 | 6/6 | 24/24 By Ishihara's plates | - | - | - | | | |
| | ආසන්න දෘෂ්ඨිය | - | - | - | J – 01 (සිංහල) N – 08 (ඉංග්‍රීසි) | | | - | - | - | - | - | - |
| වෙනත් කාණ්ඩ | උපැස් රහිත | 6/9 | 6/6 | CP 2 | 6/6 | 6/6 | CP 2 | 6/6 | 6/6 | CP 2 | - | - | - |

වෘත්තීය කාණ්ඩය යටතේ ඇති උපාධි පාඨමාලා

| සේවය | උපාධිය |
|---|---|
| ශ්‍රී ලංකා යුධ හමුදාව | වෛද්‍ය , ඉංජිනේරු (ගෞරව) , |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | වෛද්‍ය |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | වෛද්‍ය |
| ශ්‍රී ලංකා පොලීසිය | වෛද්‍ය |

වෙනත් කාණ්ඩ යටතේ ඇති උපාධි

- මෙහි සඳහන් නොවෙන අනිත් සියලුම උපාධි.

**සටහන :-** යම් අයදුම්කරුවෙකු ජාතික මට්ටමේ ක්‍රීඩා කුසලතා හෝ වර්ණ ලබා ඇත්නම් හෝ ජනාධිපති/අගමැති බාලදක්ෂයෙකු/දක්ෂිකාවක නම් හෝ පාසල් ශිෂ්‍යභට බණ්ඩයේ යටත් නිලධාරියෙකු (ජ්‍යෙෂ්ඨ/කනිෂ්ඨ) නම් හෝ ශිෂ්‍යභට සැරයන් හෝ ඉන් ඉහල තනතුරක් දරා ඇත්නම් ඉහත සඳහන් ශාරීරික මිනුම් පිළිබඳ අවශ්‍යතාවයන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරන මණ්ඩලය මගින් පත්කරනු ලබන අවසාන සම්මුඛ පරීක්ෂණ තේරීම් කමිටුව විසින් ලිහිල් කිරීමට අවකාශය ඇත.

මෙහිදී ජාතික මට්ටමේ ක්‍රීඩා කුසලතාවයන් යනු යම් අයදුම්කරුවෙකු වයස අවුරුදු 17/19 න් පහල කාණ්ඩයේ පහත කුසලතා ලබා තිබීම වේ.

කේවල තරග - 1 වන/ 2 වන/ 3 වන ස්ථාන
කණ්ඩායම් තරග - ශූරතාව / ප්‍රථම අනුශූරතාව

⋆ යම් අයදුම්කරුවෙකු අ.පො.ස. උසස් පෙළ විභාගයේ දී 1.800 හෝ ඊට වැඩි Z අගයක් ලබා ඇත්නම් එවන් අයදුම්කරුවෙකු වෛද්‍ය උපාධි පාඨමාලාව හා ඉංජිනේරු උපාධි පාඨමාලාව සඳහා ඉල්ලුම් කරනවිට අයදුම්කරුගේ /කාරියගේ උස පිරිමි අයදුම්කරුවන් සඳහා 5' 4" හා කාන්තා අයදුම්කාරියන් සඳහා 5' 2" ලෙස ලිහිල් කරනු ලැබේ.

⋆ අදාල සේවාවන් හා ශ්‍රී ලංකා පොලීසිය මගින් නියමකර ඇති දෘෂ්ඨි දර්ශණය සඳහා වූ අවම සම්මතයන් සපුරාලීම අත්‍යවශ්‍ය වේ.

ඈ. අයදුම්කරු මනා සෞඛ්‍යය තත්ත්වයක සිටිය යුතු අතර ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරන මණ්ඩලයේ සභාපති සෑහීමට පත්වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීම මෙන්ම පිළිගත් ආකෘතියට අනුව සකසන ලද සෞඛ්‍යය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය ඉදිරිපත් කිරීම අවශ්‍යය වේ. තවද, අධ්‍යයන පාඨමාලාවට තේරී පත්වීමට පෙර යම් අයදුම්කරුවෙක් විසින් සෞඛ්‍යය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රයෙහි අසත්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් එවැනි අයදුම්කරුවෙක් අධ්‍යයන කටයුතු සඳහා නුසුදුස්සකු වන අතර අසත්‍ය තොරතුරු සැපයීම හේතුවෙන් අධ්‍යයන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

සෞඛ්‍යය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (www.kdu.ac.lk) ලබා ගත හැකිය.

5. **සේවා කොන්දේසි:-** තෝරාගනු ලබන අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ රත්මලාන හෝ සූරියවැව දක්ෂිණ මණ්ඩපයේ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් හෝ ශිෂ්‍ය පොලිස් නිලධාරීන්/නිලධාරිනියන් ලෙස බඳවා ගැනේ. ඔවුන් 1981 අංක 68 දරණ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත සහ එම පනතේ සංශෝධනයන්ටද අනුකූලව විශ්වවිද්‍යාලය මඟින් කලින් කලට පනවන ලද්දාවූ නීති, රෙගුලාසි සහ නියෝගයන්ට යටත් වනු ඇත. වෛද්‍ය උපාධි පාඨමාලාව සඳහා බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්වූ දින සිට සහ ශ්‍රී ලංකා පොලීසියේ පරීක්ෂක ශ්‍රේණියේ තනතුර සඳහා ස්ථිර වූ දින සිට අඛණ්ඩ සහ නිරන්තර අනිවාර්ය වසර 20 කට නොඅඩු සේවා කාලයක් සේවය කළ යුතුය.

අනෙකුත් උපාධි පාඨමාලාවන් සඳහා බඳවාගනු ලබන අපේක්ෂකයන් නිත්‍ය සේවාවේ අධිකාරියට පත් වූ දින සිට අනිවාර්ය වසර 12කට නොඅඩු සේවා කාලයක් සේවය කළ යුතු වේ.

තවද, උපාධි පාඨමාලාවන් හදාරන කාලය අතරතුරදී වෛද්‍ය හේතුන්මත හෝ වෙනත් ඕනෑම හේතුවක් මත උපාධි පාඨමාලාව හැර යන කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් හෝ ශිෂ්‍ය පොලිස් නිලධාරීන්/නිලධාරිනියන් හට කිසිම අයුරකින් උපාධිය ලබානොදීමට කටයුතු කරනු ඇත.

6. බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීම හෝ පොලීසියේ පරීක්ෂක ශ්‍රේණියට පත් කිරීම හා අදාල උපාධිය ලබා ගැනීමෙන් පසුව එම සේවාවන්ට අදාළ වන පරිදි අනිවාර්ය සේවා කාලයක් සේවය කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

7. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුගේ/නිලධාරිනියකගේ මාසික වැටුප ආසන්න වශයෙන් රු. 45,000/- ක් පමණ වේ. මෙයට අමතරව පහත සඳහන් පහසුකම්ද සපයනු ලැබේ.

I. ආහාර හා නවාතැන්
II. නිල ඇඳුම්
III. අනුගාමික සේවාවන්
IV. ක්‍රීඩා හා විනෝද පහසුකම්
V. වෛද්‍ය පහසුකම්

- උපාධි අපේක්ෂක ශිෂ්‍ය පොලිස් නිලධාරි/ නිලධාරිනියන්ට හිමි වැටුප් හා දීමනා පොලිස් බඳවා ගැනීම් ක්‍රියාපටිපාටියට අනුව මාසිකව ගෙවනු ලැබේ. මෙයට අමතරව පහත සඳහන් පහසුකම්ද සපයනු ලැබේ.

I. ආහාර හා නවාතැන්
II. නිල ඇඳුම්
III. අනුගාමික සේවාවන්
IV. ක්‍රීඩා හා විනෝද පහසුකම්
V. වෛද්‍ය පහසුකම්

8. ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේවාවන්හි අධිකාරියට හෝ ශ්‍රී ලංකා පොලීසියේ පරීක්ෂක ශ්‍රේණියේ තනතුරට පත්කිරීමෙන් අනතුරුව ඔවුන් තම පදවිවලට අදාළ වන පරිදි එම සේවාවන්හි හෝ ශ්‍රී ලංකා පොලීසියේ බලපාන වැටුප් සහ දීමනා සඳහා හිමිකම් ලබනු ඇත.

අ. පහත සඳහන් මාසික දීමනාවන්ද ගෙවනු ලැබේ.

I. සුදුසුකම් දීමනා
II. ආහාර දීමනාව (ශිෂ්‍ය පොළිස් නිළධාරීන්ට හා නිළධාරිනියන්ට අයත් නොවේ)
III. ඇතුලත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාවක් (විවාහක නිලධාරීන්ට පමණක්)
III. නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව

ආ. පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ./ දීමනා ගෙවනු ලැබේ.

I. ඇතුලත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලයේ නේවාසික පහසුකම්
II. කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී
III. නිල ඇඳුම් දීමනා
IV. විවාහක නිලධාරීන්ට අනුගාමික දීමනා/ අවිවාහක නිලධාරීන්ට අනුගාමික සේවය (ශිෂ්‍ය පොළිස් නිළධාරීන්ට හා නිළධාරිනියන්ට අයත් නොවේ)

9. ශ්‍රී ලංකා යුධ, නාවික, ගුවන් හමුදා සහ පොලිස් නිලධාරීන්ගේ වැටුප් හා සේවා කොන්දේසි පහත සඳහන් රෙගුලාසි මගින් පාලනය වනු ඇත.

අ. යුධ හමුදා/නාවික හමුදා/ ගුවන් හමුදා වැටුප් සංග්‍රහය

ආ. යුධ හමුදා/ නාවික හමුදා/ගුවන් හමුදා නිලධාරීන් උදෙසා ශ්‍රී ලංකා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන වලංගු රෙගුලාසි

ඇ. ශ්‍රී ලංකා *ගැසට් පත්‍රයේ* පළ කරන වලංගු යුධ හමුදා/ නාවික හමුදා/ ගුවන් හමුදා සහ විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය

ඈ. ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් හා නිලධාරිනියන් ගේ මාසික වැටුප් හා සේවා තත්ත්වයන් පොලිස් බඳවා ගැනීම් ක්‍රියා පටිපාටිය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලට අනුකූලව සිදුකරණු ලැබේ.

ඉ. ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් හා නිලධාරිනියන් ගේ විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලට යටත් වනු ලැබේ.

10. පුහුණුවීම් කාලය තුළ දී උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් හා ශිෂ්‍ය පොලිස් නිලධාරීන්/ නිලධාරිනියන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ/හෝ අදාළ හමුදාපතිවරු සහ/හෝ පොලිස්පති විසින් නියම කරනු ලබන පුහුණුවීම් වල නිරත විය යුතු වේ.

11. පුහුණුව ලබන උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් හා ශිෂ්‍ය පොලිස් නිලධාරීන්/ නිලධාරිනියන් පුහුණුවීම් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඕනෑම ප්‍රදේශයකට පත්කොට යැවිය හැකිය.

12. පුහුණුව ලබන උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් හා ශිෂ්‍ය පොලිස් නිලධාරීන්/ නිලධාරිනියන් ඔවුන් සඳහා වෙන් කොට ඇති නේවාසික ස්ථානයන්හි සිටිය යුතු අතර ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ හෝ අදාළ වෙනත් සේවා ආයතන මගින් පනවන ලද දින චර්යාවන් අනුගමනය කළ යුතු වේ.

13. භාෂා අවශ්‍යතා - තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් මේ දක්වා පනවනු ලැබ ඇත්තා වූද, ඉදිරියේදී පනවනු ලැබිය හැකි වූද, නීතීන්ට අනුකූලව කටයුතු කළ යුතු වේ.

14. අනන්‍යතාවය ඔප්පු කිරීම :- අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ ගුවන් ගමන් බලපත්‍රය හෝ තැපැල්පති විසින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

15. (1) අයදුම්පත් :- මේ සඳහා අයදුම් කළ හැකි වනුයේ මෙම විශ්වවිද්‍යාලයේ නිළ වෙබ් අඩවිය (www.kdu.ac.lk) ඔස්සේ විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම මගින් පමණි. (අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් එකී විද්‍යුත් අයදුම්පතෙහි දක්වා ඇත).තැපැල් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

(11) මෙම විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියේ අදාළ කොටසේ ඇති විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කර එක් උපාධි පාඨමාලාවක් සඳහා නැවත නොගෙවනු ලබන රුපියල් එක්දහස් පන්සියයක (රු:1500/=) මුදලක් අයදුම්පත් ගාස්තු ලෙස මාර්ගගත ක්‍රමයට (Online Payment) ගෙවිය යුතුය. එලෙස මාර්ගගත ක්‍රමයට ගෙවීමට අපොහොසත්වන අයදුම්කරුවන් <u>ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට එක් උපාධි පාඨමාලාවක් සඳහා රුපියල් එක්දහස් පන්සියයක (රු:1500/=) මුදලක් "උපකුලපති, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය" නමින් ලංකා බැංකුවේ "මොරටුව - ඉඩම" ශාඛාවේ අංක "9405831" ගිණුමට බැර කර</u>, <u>අයදුම්පත් බාරගන්නා අවසන් දිනට පෙර විශ්වවිද්‍යාලය වෙත ලබාදිය යුතුය.</u>

16. අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති හෝ ඉල්ලුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර නොමැති හෝ මෙහි සඳහන් කොන්දේසි වලට අනුකූල නොවන හෝ අයදුම්පත්, කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙන අතර, අයදුම්පත් එවීමේදී ගෙවනු ලැබූ මුදල් කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ. උපකුලපතිතුමා විසින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය

කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව, ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් සිදු කරනු ලබන අතර එසේ තෝරා ගන්නා ලද අයදුම්කරුවන් පමණක් මූලික සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලැබේ. මෙලෙස ඔබ විසින් සම්පූර්ණ කරනු ලබන විද්‍යුත් අයදුම්පත් **2022.09.26** වැනි දින හෝ ඊදිනට පෙරාතුව ලැබෙන සේ විශ්වවිද්‍යාලයේ නිළ වෙබ් අඩවිය ඔස්සේ යොමුකළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර සහ මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන්නා වූ ඉල්ලුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

17. රාජ්‍ය හෝ සංස්ථා සේවයෙහි නිරත නිලධාරීයෙකු/ නිලධාරිනියක අයදුම්පත් ඉදිරිපත්කර, එකී අයදුම්කරුවන් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය අදාළ තනතුරෙන් නිදහස් කළ හැකි බව සඳහන් අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකයක්ද තිබිය යුතුය.

18. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරණ මණ්ඩලය මගින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව, ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් කරනු ඇත. මෙසේ තෝරා ගනු ලබන්නා වූ අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් අවශ්‍යයයි තීරණය කරනු ලබන්නා වූ වෙනත් පරීක්ෂණයන්ටද පෙනී සිටිය යුතු වේ.

19. සම්මුඛ පරීක්ෂණ සහ වෙනත් පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අපේක්ෂකයින්ට එම පරීක්ෂණ පවත්වනු ලබන ස්ථාන, වේලාවන් හා දින විශ්වවිද්‍යාලීය වෙබ් අඩවිය මගින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් මෙම විශ්වවිද්‍යාලය මගින් ගෙවනු නොලැබේ.

20. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් නිලධාරී යෝග්‍යතා පරීක්ෂණයේ දී හෝ හමුදා, පොලිස් පුහුණුව අතරතුර අයදුම්කරුවන් හට සිදුවන කිසිදු ආකාරයක ආබාධ තත්ත්වයක වගකීමක් නොගන්නා අතර කිසිදු අයදුම්කරුවෙකුට කිසිදු තත්ත්වයකදී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය හෝ ශ්‍රී ලංකා රජය කිසිදු වන්දියක් නොගෙවන අතර හෝ වගකීමක් නොගනී.

21. අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරනු ලබන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට ඒ පිළිබඳව සහතිකයක් ලබා දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම හෝ නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

22. අයදුම්පත් ලද බැව් මෙම විශ්වවිද්‍යාලය විසින් දැනුම් දෙනු නොලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් සම්බන්ධව කෙරෙන විමසුම් හෝ ලියකියවිලිද පිළිගනු නොලැබේ.

23. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සහ,
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ
කළමනාකරණ මණ්ඩලයේ සභාපති.